**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2023/2024**

**FND 1212 - සිංහල ලේඛන සම්ප්‍රදාය හා සන්නිවේදනය**

**(කාලය පැ දෙකයි)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

**<u>1. එක්කෝ</u>**

'බුත්සරණෙහි භාෂා රීතිය සංස්කෘත තත්සම පද බහුල වූවකි' යන්න සනිදර්ශන ව විමසන්න.

<u>නැතහොත්</u>

සද්ධර්මරත්නාවලීකරුවාගේ භාෂා රීතියෙහි විශේෂ ලක්ෂණ කවරේද යන්න සනිදර්ශන ව පහදන්න.

2. 'පන්සිය පනස් ජාතක පොත බහු කර්තෘක කෘතියක් බව එහි භාෂා රීතිය ඇසුරින් පිළිබිඹු වේ.' මෙම මතයට පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වමින් විමසන්න.

3. දහනව වන සියවසේ ගද්‍ය රීතියෙහි විශේෂ ලක්ෂණ කවරේද යන්න ඒ යුගයේ රචිත ගද්‍යමය ආඛ්‍යාන ඇසුරින් සනිදර්ශන ව විමසන්න.

4. සිංහල ලේඛන ප්‍රභේද කවරේදැයි දක්වා ශාස්ත්‍රීය ලේඛනය හා නිර්මාණාත්මක ලේඛනය අතර වෙනස්කම් විභාග කරන්න.

5. පහත මාතෘකා අතුරින් **<u>දෙකක් (02)</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) දළදා සිරිත

(ආ) පුවත්පත් භාෂාව

(ඇ) හුදු හෙළ වහර

(ඈ) මුද්‍රිත සිංහලය